**කරච්චි ප්‍රාදේශීය සභාව**

**කිලිනොච්චි දිස්ත්‍රික්කය**

---------------------------------

1 මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 ජූලි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 නොවැම්බර් 19 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, කරච්චි ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කරච්චි ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත්, මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

---------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

වගකීම් හා වත්කම් සම්බන්ධව ගිණුම්වල නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු අවස්ථා හා වටිනාකම් යටතේ පහත වගුවෙන් දැක්වේ.

| | වගකීම් | | වත්කම් | |
|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. |
| ගිණුම්වල වැඩියෙන් දැක්වීම් | - | - | 01 | 1,999,999 |
| ගිණුම්වල අඩුවෙන් දැක්වීම් | 1 | 3,410 | - | - |

1.3.3 පැහැදිලි නොකළ වෙනස්කම්.

ආදායම් හා වියදම් ගිණුම අනුව සමාලෝචිත වර්ෂය සඳහා අයකරගත් මුළු ශුද්ධ ආදායම් හා ආදායම් ලේඛනයේ දැක්වෙන ආදායම් අතර රු. 75,450 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 බැංකු සැසඳුම්.

රු. 904 ක් වටිනා මාස 06 කට වඩා වැඩි කාල පරිච්ඡේදයක් ඉක්ම වූ උපලබ්ධි නොවූ චෙක්පතක් සම්බන්ධව පසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

1.3.5 අවිනිශ්චිත ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ස්වභාවයේ ගිණුම්වල රු. 190,629 ක් වටිනා බැර ශේෂයක් විය.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම.

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්.

2011 ජලි 29 දිනට විගණන විමසුම් 2 කට පිළතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර එම විගණන විමසුම්වල සඳහන් ගනුදෙනුවල ප්‍රමාණනය කල හැකි වටිනාකම රු. 2,325,198 කි.

(ආ) විගණනයට තොරතුරු ඉදිරිපත් නොකිරීම.

විගණනය සඳහා අවශ්‍ය තොරතුරු නොමැති වීම හේතුවෙන් රු. 66,405 ක් වටිනා ගනුදෙන සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය.

1.3.7 අනුකූල නොවීම්.

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්හි නියමයන්ට අනුකල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන් යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) <u>පනත්</u><br>(i) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(අ) වගන්තිය | වසරකට රු. 1,000 කට වැඩි ආගමික හා පොදු කටයුතු වෙනුවෙන් දැරූ වියදම් විෂයභාර ඇමතිවරයාගේ පූර්ව අනුමැතියකින් ආවරණය විය යුතුය. මෙම කටයුතු සඳහා රු. 83,767 ක් එවැනි අනුමැතියකින් තොරව ගෙවා තිබුණි |
| (ii) මෝටර් රථ පවාහන පනතේ 2(1) හා 9(1)(ඇ) වගන්ති | සභාවේ වාහන 8 ක් සඳහා ආදායම් බලපත්‍ර සහ රක්ෂණ සහතික ලබාගෙන නොතිබුණි. |
| (ආ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි</u><br>අංක 104 | සභාවේ වාහන අනතුරු 09 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) <u>චක්‍රලේඛ</u><br>2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ඡේදය | කාර්ය සාධන ඇපකරය හා විධිමත් අනුමැතිය ලබා ගැනීමකින් තොරව කොන්ත්‍රාත්කරුවෙකුට රු. 700,000 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. |
| (ඈ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රජ්‍ය පරිපාලන | වාහන වල ඉන්ධන දැවීම මාස 06 කට වරක් පරීක්ෂා කර නොතිබුණි. |

චක්‍රලේඛය

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 10,857,184 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 17,907,412 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.

2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම.

සභාපති විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම සම්බන්ධ තොරතුරු පහත දැක්වේ. යුද වාතාවරණය හේතුවෙන් සභාව විධිමත් ලෙස ක්‍රියාත්මක වී නොතිබුණු නිසා සභාව 2009 වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

| ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තත්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ | 2009 ඇස්තමේන්තුගත | 2009 තත්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 100 | - | 582 | - | - | 582 |
| බදු කුලී | 2,300 | 3,897 | - | - | - | - |
| බලපත්‍ර ගාස්තු | 2,100 | 3,070 | - | - | - | - |
| වෙනත් ආදායම් | 30,835 | 30,753 | - | - | 18,707 | - |

2.2.2 උසාවි දඩ

2010 දෙසැම්බර් 31 තෙක් විවිධ ආඥා පනත් යටතේ අදාල මහේස්ත්‍රාත් උසාවි විසින් පනවා තිබූ උසාවි දඩ ගණනය කර අයකර ගැනීමට සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.3 මුද්දර ගාස්තු.

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.4 ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබූ ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු වලින් සභාව විසින් රු. 525,025 ක් වටිනා ගාස්තු ගැසට් නිවේදන වලින් තොරව අයකර ගෙන තිබුණි.

(ii). ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබූ ප්‍රචාරක දැන්වීම් පුවරු 17 කින් රු. 478,200 ක් වටිනා ගාස්තු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව 2010 නොවැම්බර් 13 දින සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂණයකදී අනාවරණය විය.

2.3 වියදම් ව්‍යුහය.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තත්‍ය වියදම් විචලනයන් සමඟ පහත දැක්වේ. යුද කටයුතු හේතුවෙන් සභාව විධිමත් ලෙස ක්‍රියාත්මක වී නොතිබුණු නිසා සභාව 2009 වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තත්‍ය | විචලනය | අයවැයගත | තත්‍ය | විචලනය |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පුද්ගල පඩිනඩි | 24,000 | 20,622 | 3,378 | - | 800 | 800 |
| වෙනත් | 11,200 | 6,241 | 4,959 | - | - | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උප එකතුව | 35,200 | 26,863 | 8,337 | - | 800 | 800 |
| ප්‍රාග්ධන වියදම් | 664,500 | 12,420 | 652,080 | - | - | - |
| මුළු එකතුව | 699,700 | 39,283 | 660,417 | - | 800 | 800 |

2.4 මානව සම්පත් කළමනාකරණය.

2.4.1 අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය

2010 දෙසැම්බර් 31 උනට සභාවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තත්‍ය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 05 | 01 |
| ද්විතියික මට්ටම | 34 | 32 |
| ප්‍රාථමික මට්ටම | 53 | 47 |
| එකතුව | 92 | 80 |

2.4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත මානව සම්පත්.

2010 සැප්තැම්බර් 09 දින කිලිනොච්චි පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් රියදුරෙකුට ස්ථාන මාරු කර එවා තිබුනද සභාව විසින් ඔහුට 2010 දෙසැම්බර් 31 වන තෙක් වාහනයක් වෙන් කර නොතිබුණි. කෙසේ වුවද මෙම කාලය සඳහා වැටුප් වශයෙන් රු. 78,504 ක් ගෙවා තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය

2.5.1 ලැබිය යුතු ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 23,438,424 ක් වූ අතර වසර 01 කට වඩා වැඩි කාල පරිච්ඡේදයකට අදාල ගිණුම් ශෙෂවල වටිනාකම රු. 22,758,635 ක් විය.

2.5.2 අයකර ගත යුතු සේවක ණය.

2010 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු සේවක ණය ශේෂවල එකතුව රු. 4,972,616 ක් වූ අතර වසර 01 කට වඩා වැඩි කාල පරිච්ඡේදයකට අදාල ගිණුම් ශේෂවල වටිනාකම රු. 4,725,300 ක් විය.

2.5.3 සමීක්ෂණය නොකළ වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණනය කරන ලද සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් සනාථ නොවූ වත්කම්වල වටිනාකම රු. 60,003,443 ක් විය.

2.6 අරමුණට පටහැනි ක්‍රියාකාරකම්.

රු. 378,612 ක් වටිනා පහත සඳහන් දරන ලද වියදම් අරමුණ වලට පටහැනි බව විගණනයේදී නිරීක්ෂණය විය.

| | ක්‍රියාකාරකම් | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| (අ) | පෙර පාසල් ක්‍රියාකාරකම් සඳහා ගෙවීම් සිදු කිරීම. | 219,776 |
| (ආ) | ඩෙංගු වැඩ සටහන සඳහා වියදම් දැරීම. | 158,836 |
| | | 378,612 |

2.7 කාර්ය සාධනය.

සභාව විසින් වාර්ෂික ක්‍රියාකාර් සැලැස්මක් ගිණුම් වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි. එමනිසා අපේක්ෂිත අරමණු හා ඒ පිළිබඳ ප්‍රගතිය තහවුරු කර ගැනමට නොහැකි විය. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘතියේ විස්තර | වෙන්කල ප්‍රමාණය | දැරූ වියදම් | වියදම් නොකල ප්‍රමාණය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රාග්ධන වත්කම් හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | 664.5 | 12.4 | 652.1 |

2.8 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) සභාව විසින් කාර්ය සාධන ඇපකරයක් ලබා නොගෙන ධර්මපුරම්වල තාවකාලික වෙළඳ මඩු ඉදිකිරීමේ අත්තිකාරමක් වශයෙන් රු. 100,000 ක මුදලක් ගෙවා තිබුණි. මාස 09 කට පසු කොන්ත්‍රාත්කරු විසින් වැඩ ආරම්භ කිරීමකින් තොරව ඉහත අත්තිකාරම් මුදල නැවත සභාවට ගෙවා තිබුණි.

(ආ) කිලිනොච්චි වල තාවකාලික වෙළඳ මඩු ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2010 මාර්තු 16 දින තීරණයක් ගෙන තිබුණද 2010 පෙබරවාරි 10 දින ගිවිසුම අත්සන් කර තිබුණි.

(ඇ) වෙළඳසැල් බදු ගැනීම සඳහා ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කල යුතු වුවත්, සභාව විසින් කිලිනොච්චි වෙළඳපොලෙහි ඉදිකළ වෙළඳසැල් ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය නොකර බදු දී තිබුණි.

2.9 අභ්‍යන්තර විගණනය.

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. පද්ධති හා පාලනය.

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) අයවැය පාලනය